VICTORIAN THERAPEUTICS ADVISORY GROUP

Sinhalese

# ඔබේ ප්‍රතිජීවක පාවිච්චිය

මේ තොරතුරු ලබාදෙන්නේ බෙහෙත් වට්ටෝරුව හෝ සපයන ලද ප්‍රතිජීවක සමග නිකුත් කිරීම සඳහාය. සුවිශේෂ උපදෙස් සඳහා බෙහෙත් වට්ටෝරුව හෝ ලේබලය බලන්න.

## ප්‍රතිජීවකයක් යනු කුමක්ද?

ප්‍රතිජීවක යනු බැක්ටීරියා වලින් හටගන්නා ආසාදනයනට ප්‍රතිකාර කිරීමට හෝ වැළැක්වීමට පාවිච්චි කරන බෙහෙත්ය.

ප්‍රතිජීවක මගින් ඔබේ ශරීරයේ බැක්ටීරියා මරා දැමීම හෝ බැක්ටීරියා වර්ධනය නැවැත්වීම සිදු කරයි. වෙන වෙනත් බැක්ටීරියා විශාල සංඛ්‍යාවක් තිබේ. ඔබේ වෛද්‍යවරයා ඔබේ විශේෂ අවශ්‍යතා සාකච්චා කර ඔබට සුදුසු ප්‍රතිජීවකයක් නිර්දේශ කරනු ඇත.

රෝහලේදී ඔබට එන්නතක් හෝ පෙත්තක් හෝ කරලක් හෝ පැණියක් ලෙසට ප්‍රතිජීවකයක් ලබා දුන්නා විය හැකිය. ඔබව රෝහලෙන් මුදා හැරිය පසුව, ආසාදනයට ප්‍රතිකාර පිණිස හෝ වැළැක්වීම පිණිස එම ප්‍රතිජීවක පරිපාටිය ඔබ නොකඩවා සම්පූර්ණ කළ යුතුය.

## මගේ ප්‍රතිජීවක ප්‍රතිකාරය ගැන මම දැන ගත යුත්තේ මොනාද?

රෝහලෙන් පිටවීමට පෙර පහත දේ වෛද්‍යවරයා, සාත්තු සේවකයා හෝ ඖෂධවේදියා සමග සාකච්චා කරන්න:

- ඔබට ප්‍රතිජීවිකයක් නිර්දේශ කර ඇති හේතුව කුමක්ද
- ඔබ දවසට කී වතාවක් ඔබේ ප්‍රතිජීවිකය පාවිච්චි කළ යුතුද
- ඔබේ ප්‍රතිජීවිකය පාවිච්චි කළ යුත්තේ ආහාර සමගද, නැත්නම් හිස් බඩද
- ඔබේ ප්‍රතිජීවිකය කොපමන කලක් පාවිච්චි කළ යුතුද
- ඇති විය හැකි අතුරු ඵල මොනවාද, අතුරු ඵල ඇතිවුවොත් කළ යුත්තේ කුමක්ද
- ඔබේ ප්‍රදේශයේ වෛදවරයා හමු විය යුත්තේ කිනම් විටද

රෝහලෙන් පිටවූ පසු:

- ලේබලයේ ඇති උපදෙස් වලට අනුව ඔබේ ප්‍රතිජීවික පාවිච්චි කරන්න
- ඔබේ ප්‍රතිජීවිකය පාවිච්චි කිරීමට මතක තබා ගැනීම අපහසු නම් සංඥාවක් තබා ගන්න නැතිනම් ඔබට මතක් කරන ලෙස පවුලේ කෙනකුගෙන් හෝ මිතුරකුගෙන් ඉල්ලා සිටින්න
- ඔබට ගුණයක් දැනුනද, ඔබේ ප්‍රතිජීවිකය වෛද්‍යවරයා ඔබට පවසන ලද දවස් ගණන අවසන් වන තෙක් පාවිච්චි කරන්න

## ප්‍රතිජීවක වලට අසාත්මිකතාව

ප්‍රතිජීවක වලට ඇතිවන අසාත්මිකතාව විරල නමුත් එය බරපතල වීය හැකිය.

මින් පෙර ප්‍රතිජීවක වලට ඔබ යම් ප්‍රතික්‍රියාවක් දක්වා ඇත්නම් ඒ බව කරුණාකර ඔබේ වෛද්‍යවරයා, සාත්තු සේවකයා හෝ ඖෂධවේදියාට කියන්න. ඔබට හැකි සියළුම විස්තර ඔවුනට සපයන්න.

## අතුරු ඵල

සෑම ඖෂධයකින් මෙන්ම ප්‍රතිජීවක වලින්ද අතුරු ඵල ඇති කිරීමට පුළුවන.

ඔක්කාරය, වමනය, පාචනය, බඩ පුරවා දැමීම සහ අජීර්ණය සමහර මෘදු අතුරු ඵලයන් වේ.

බරපතල අතුරු ඵල දුර්ලභය. ඔබට පහත පෙනෙන අතුරු ඵල ඇති වුවහොත් වහාම වෛද්‍යවරයෙක් අමතන්න:

- සමේ පලු මතුවීම
- හුස්ම ගැනීමට අපහසු වීම
- 40°C ට වඩා උණ
- දින 3 කට වඩා කල්ගත පාචනය

## ප්‍රතිජීවක ප්‍රතිරෝධය

ප්‍රතිජීවිකයන්ට එරෙහිව සටන් කිරීමට බැක්ටීරියා විසින් අලුත් ක්‍රම සොයා ගැනීමට පුළුවන. එය 'ප්‍රතිජීවක ප්‍රතිරෝදය' ලෙස හැඳින්වේ. මින් අදහස් වන්නේ කලින් සාර්ථක වූ ප්‍රතිජීවකයක් දැන් ඔබට ප්‍රතිකාර කිරීමට අසාර්ථක වීමයි.

ප්‍රතිජීවක ප්‍රතිරෝදයට එක් ප්‍රධාන හේතුවක් වන්නේ අනවශ්‍ය අවස්ථා වලදී ප්‍රතිජීවීක භාවිතා කිරීමයි. (උදා: සෙම්ප්‍රතිශ්‍යාව හෝ ඉන්ෆ්ලුඑන්සාව සඳහා භාවිතා කිරීම).

ඔබේ ප්‍රතිජීවිකය ගැන ඔබට කිසියම් ප්‍රශ්න ඇත්නම් ඔබේ වෛද්‍යවරයා, සාත්තු සේවකයා හෝ ඖෂධවේදියාට කියන්න.

**ඔබට නියම කර තිබෙන ප්‍රතිජීවකය:**

**පාවිච්චි කරන ආකාරය:**

**ඔබ මෙය කොපමන කල් පාවිච්චි කළ යුතුද?**

Consumer reviewed
March 2020

English

# Taking your antibiotics

This information is intended to accompany prescription or supply of antibiotics. Please refer to prescription or label for specific instructions.

**What is an antibiotic?**

Antibiotics are medicines used to treat or prevent infections caused by bacteria.

Antibiotics kill or stop the growth of bacteria in your body. There are many different types of antibiotics. Your doctor will discuss your individual needs and recommend a suitable antibiotic for you.

In hospital, you may have been given an antibiotic in the form of an injection, or as a tablet, capsule or syrup. You will need to continue the course of antibiotics when you are discharged from hospital to treat or prevent infection.

**What do I need to know about my antibiotic treatment?**

Before leaving hospital discuss with a doctor, nurse or pharmacist:

- why you are being prescribed an antibiotic
- how many times a day you need to take your antibiotic
- if your antibiotic needs to be taken with food or on an empty stomach
- how long to take your antibiotic for
- possible side effects and what to do if they happen
- when to see your local doctor

After leaving hospital:

- take your antibiotics as instructed on the label
- if you have trouble remembering to take your antibiotic, set an alarm or ask family or a friend to remind you
- take your antibiotic for the number of days the doctor has told you to, even if you are feeling better

**Allergies to antibiotics**

Allergies to antibiotics are rare but can be serious.

Please tell your doctor, nurse or pharmacist if you have had a reaction to an antibiotic in the past. Give them as many details as you can.

**Side effects**

Like all medicines, antibiotics can cause side effects.

Some mild side effects include nausea, vomiting, diarrhoea, bloating and indigestion.

Serious side effects are rare. Contact a doctor immediately if you have:

- a skin rash
- difficulty breathing
- a fever higher than 40°C
- diarrhoea which lasts for more than 3 days

**Antibiotic resistance**

Bacteria can develop new ways to fight against antibiotics, it is called 'antibiotic resistance'. This means that an antibiotic which used to work may no longer be able to treat your infection.

One of the main causes of antibiotic resistance is antibiotics being used when they are not needed (e.g. for a common cold or flu).

If you have any questions about your antibiotic, talk to your doctor, nurse or pharmacist.

**The antibiotic prescribed for you is:**

**How to take it:**

**How long do you need to take it for?**

Consumer reviewed
March 2020